රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 4/91

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1991 පෙබරවාරි මස 17 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් හා
සියළුම දිසාපතිවරුන් වෙත.

## උතුරු - නැගෙනහිර පළාත් වල පවතින තත්ත්වයෙන් පීඩාවිඳින රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු.

1990.08.07 දින අංක: 33/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. උතුරු සහ නැගෙනහිර පළාත් වල සේවය කරන රාජ්‍ය නිලධාරීන්ට 1990 ජූනි මාසය සඳහා ඉහත සඳහන් චක්‍රලේඛයෙන් විශේෂ නිවාඩු ලබා දී ඇත. අනතුරුව පහත සඳහන් දිස්ත්‍රික්ක වල සේවය කරන නිලධාරීන්ට එම දිස්ත්‍රික්කය ඉදිරියෙන් දක්වා ඇති කාල සීමාවන් සඳහා එම විශේෂ නිවාඩු පහසුකම් දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

| | | |
|---|---|---|
| 1. | අම්පාර | - 90.06.12 සිට 90.09.01 දක්වා |
| 2. | මඩකලපුව | - 90.06.12 සිට 90.09.03 දක්වා |
| 3. | ත්‍රිකුණාමලය | - 90.06.12 සිට 90.08.01 දක්වා |

02. ඉහත සඳහන් දීර්ඝ කරන ලද කාල සීමාවෙන් පසුවත්, මෙම දිස්ත්‍රික්ක තුනෙහි සේවය කරන නිලධාරීන් සේවයට වාර්තා කර නොතිබුනේ නම් තනතුරු හැරයාමේ දැන්වීම් ඔවුන්ට නිකුත් කළ යුතුව තිබිණ. කෙසේ හෝ තනතුර අතහැර ගිය එවැනි නිලධාරියෙකු පසු අවස්ථාවකදී අ හියාචනයක් ඉදිරිපත් කළහොත්, පළාත් සභා සේවකයින් සම්බන්ධයෙන් නම් උතුරු - නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරතුමා විසින්ද, මධ්‍යම ආණ්ඩුවේ නිලධාරීන් සම්බන්ධයෙන් නම් ඒ ඒ දිස්ත්‍රික්ක වල දිසාපති වරුන් විසින්ද පෞද්ගලිකවම එම අභියාචනා සළකා බැලීම මැනවි.

04. උතුරු සහ නැගෙනහිර පළාත් වලින් පිටත ප්‍රදේශ වල සේවය කරන, එහෙත් නියමිත පරිදි නිවාඩු අනුමත කරවා ගෙන එම පළාත් වලට ගොස් ආපසු සේවා ස්ථානවලට වාර්තා නොකළ රාජ්‍ය නිලධාරීන් ද සිටින අවස්ථා තිබිය හැක. එවැනි නිලධාරීන්ටද තනතුරු හැරයාමේ නිවේදන නිකුත් කළ යුතුව තිබිණ. කෙසේ හෝ එවැනි නිලධාරියකු ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ස්වේච්ඡාවෙන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්නේ නම්, එවැනි නිදහසට කරුණු දෙපාර්තමේන්තු ප්‍රධානිය විසින් පෞද්ගලිකව සලකා බලා, පිළිගත හැක්කේ නම් පහත සඳහන් පරිදි නිවාඩු අනුමත කළ හැකිය.

i. යම් නිලධාරියෙකු 1990.06.12 සිවට පෙර නිවාඩු ගියේ නම් මෙහි 05 ජේදයේ කොන්දෝසි වලට යටත්ව එවැනි නිලධාරියෙකුට <u>විශේෂ නිවාඩු</u> අනුමත කළ හැකිය.

ii. යම් නිලධාරියකු 1990.06.12 දින හෝ ඊට පසුව නිවාඩු ගියේ නම් එවැනි නිලධාරියෙකුට ද මෙහි 05 ජේදයේ කොන්දේසි වලට යටත්ව ඔහුගේ <u>පෞද්ගලික</u> <u>නිවාඩු</u> කළ හැකිය.

05. මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධව නිවාඩු අනුමත කරන බලධාරියා සෑහිමට පත්වීමෙන් පසුව පමණක් ඉහත 03 සහ 04 යටතේ සඳහන් නිලධාරීන්ට නිවාඩු අනුමත කළ යුතුය.

i. තමාගේ පාලනයෙන් තොර හේතු නිසා නිලධාරියාට රාජකාරියට වාර්තා කිරීමට අපහසු වීම.

ii. නිලධාරියා අනාථ කඳවුරක ජීවත්වීම හෝ රජයේ වෙනත් කාර්යාලයක වාර්තා කිරීම / (අනාථ කඳවුරක නොසිටියේ නම් ) අනාථ කඳවුරුක් භාර නිලධාරියා විසින් හෝ ආරක්ෂක සේවයේ හෝ පොලිස් සේවයේ නිලධාරියෙකු විසින් කරන ලද සහතිකයක් ලබා ගැනීම මගින් ලිඛිත සාක්ෂි ඔහු නොපැමිණි කාලය වෙනුවෙන් ඉදිරිපත් කිරීම.

06. විශේෂ නිවාඩු හෝ පෞද්ගලික නිවාඩු (වැටුප් රහිත නිවාඩු හැර) අනුමත කරන නිලධාරීන්ට එම කාල සීමාවන් සඳහා ඔවුන්ගේ වැටුප් ගෙවිය හැක.

අ.කළේ./ (ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.